# පුරප්පාඩු

## කර්මාන්තශාලා නිලධාරී තනතුර

**(ස්ථිර / කොන්ත්‍රාත්)**

**වසර 30 පුරා තේ නිෂ්පාදන ක්ෂේත්‍රයේ විශිෂ්ඨයකු ලෙස නම් දරා සිටින සී/ස කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගමේ කර්මාන්තශාලා නිලධාරී තනතුර සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

**සුදුසුකම් හා පළපුරුද්ද**

| බාහිර අයදුම්කරුවන් | අභ්‍යන්තර අයදුම්කරුවන් |
|---|---|
| අධ්‍යන පොදු සහතිකපත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී<br>I. සිංහල / දෙමළ<br>II. ගණිතය<br>යන විෂයන් ඇතුළුව විෂයන් 04 කට සම්මාන සාමාර්ථයන් සහිතව විෂයන් හයකින් (06) සමත්වීම.<br>හා<br>තේ කර්මාන්තශාලා ක්ෂේත්‍රයෙහි වසර 10ක පළපුරුද්දක් තිබීම හා ඉන් අවම වශයෙන් වසර 05ක් අදාල තනතුරෙහි හෝ ජ්‍යෝෂ්ඨ සහකාර කම්හල් නිලධාරී හෝ ඒ හා සමාන තනතුරක සේවා පළපුරුද්දක් සමඟ සතුටුදායක සේවා කාලයක් තිබීම.<br>NIPM ICFO – IC 02 (Induction Course for Tea Factory Officers) හෝ NCTF – CC – 04 (National Certificate in Tea Manufacture & Factory Management Examination) පාඨමාලාව හදාරා තිබීම, අධ්‍යන පොදු සහතිකපත්‍ර (උසස් පෙළ) සමත්ව තිබීම, ERP System සමඟ කටයුතු කිරීමේ හැකියාව විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ. | බාහිර සුදුසුකම් හෝ සී/ස කලුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගමේ ජ්‍යෝෂ්ඨ සහකාර කර්මාන්තශාලා නිලධාරී තනතුරක අදාළ විෂය ක්ෂේත්‍රයෙහි වසර 05කට නොඅඩු සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම. |

**වයස**

අවුරුදු 30ට නොඅඩු සහ අවුරුදු 45ට නොවැඩි අය විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

| මාසික වැටුප් පරිමාණය | අනෙකුත් වරප්‍රසාද |
|---|---|
| 2026/28 සාමූහික ගිවිසුමට අනුව<br>රු. 54,620.80 3 x 1,775.00 – 59,945.00 (2028) | • නිල නිවසක් හෝ කුලී නිවාස දීමනාවක්<br>• වාර්ෂික ප්‍රසාද දීමනා<br>• ආකර්ෂණීය වෛද්‍ය රක්ෂණාවරණයක් (පවුලේ සාමාජිකයින් ඇතුළුව)<br>• සේවක අර්ථසාධක අරමුදල් හා සේවක භාරකාර අරමුදල්<br>• මාසික තේ කොළ දීමනාව<br>• සේවකයින් වෙත ලබා දෙන අනෙකුත් දීමනා සහ වරප්‍රසාද |

ඔබගේ අයදුම්පත ජීව දත්ත සමඟ අධ්‍යාපන සුදුසුකම්, වෘත්තීය සුදුසුකම් සහ පළපුරුද්ද පිළිබඳ විස්තර ඇතුළත් කර එම සුදුසුකම් සනාථ කල හැකි සහතිකවල පිටපත් සමඟ ඉදිරිපත් කළ යුතුය

තවද, දැනටමත් රජයේ, සංස්ථා, මණ්ඩලවල සේවයේ යෙදීසිටින අයදුම්කරුවන් තම අයදුම්පත් ආයතන ප්‍රධානීන් මගින් එවිය යුතුය.

සෑම අයදුම්කරුවෙක්ම මනා ශරීර සෞඛ්‍යකින් හා ධනාත්මක අදහස්වලින් පිරි ක්‍රියාශීලි අයෙකු විය යුතු අතර, දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමේ හැකියාව තිබිය යුතුය.

ගාල්ල, මාතර හා මහනුවර දිස්ත්‍රික්ක වල පදිංචි පිරිමි අයදුම්කරුවන් සඳහා ප්‍රමුඛතාවය ලබාදෙනු ලැබේ.

තෝරා ගැනීම සඳහා කිනම් අයුරකින් හෝ අනිසි බලපෑම් කිරීම නුසුදුසුකමට හේතු වනු ඇති අතර, අධ්‍යක්ෂක මණ්ඩල තීරණය අවසාන තීරණය වේ.

ඉහත සුදුසුකම් සපුරා ඇති ඔබගේ ආදර්ශ ආකෘතියට (**www.kalubowitiyanatea.lk** වෙබ් අඩවියෙන් බාගත හැක.) අනුව සකස් කරන ලද අයදුම්පත්‍රය 2026.02.08 දිනට ප්‍රථම පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු අතර ලිවුම් කවරයේ වම් කෙළවර ඉල්ලුම් කරන තනතුර සඳහන් කළ යුතුය.

**සභාපති, සී/ස කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගම, නො. 53, රත්නායක මාවත, පැලවත්ත, බත්තරමුල්ල**